සැ. යු. - 2009.08.14 දින පළ වූ අංක 1,615 දරන ගැසට් පත්‍රයේ I-III (අ) කොටස පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,616 - 2009 අගෝස්තු මස 21 වැනි සිකුරාදා - 2009.08.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1166 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1168 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1169 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1172 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1174 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 අගෝස්තු මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 අගෝස්තු මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - නුගේගොඩ

නුගේගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම්පෑමක් නොකල පහත සඳහන් භාණ්ඩ 2009.09.12 වැනි දින පෙ.ව. 9.30 ට රත්මලාන ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට අයත් භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කල යුතුයි.

03. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය මත එදින පෙ.ව. 9.00 සිට පෙරවරු 9.30 දක්වා භාණ්ඩ පරීක්ෂා කල හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගන්නා අවස්ථාවන් හිදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ සම්පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා එම අවස්ථාවේදී ම මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. භාණ්ඩ ගැනුම්කරු ඔහුගේ ජාතික හැඳුනුම්පත් රැගෙන ආ යුතුය.

වසන්ත ජිනදාස,
මහෙස්ත්‍රාත් - නුගේගොඩ.

2009 ජූලි මස 31 වැනි දින,
නුගේගොඩ, මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|
| 01 | A. R. 472/02 | අංක 115-1258 යතුරු පැදිය |
| 02 | A. R. 133/07 | අංක 115-7362 සුදු පැහැති යතුරු පැදිය |
| 03 | A. R. 391/02 | අංක 120-0956 සුදු පැහැති ට්‍රේල් යතුරු පැදිය |
| 04 | A. R. 2003/06 | අංක 8 ශ්‍රී 7840 යතුරු පැදිය |
| 05 | A. R. 747/03 | අංක 145 - 3941 යතුරු පැදිය |
| 06 | A. R. 321/06 | අංක 157-7617 ඩෙලිට් යතුරු පැදිය |
| 07 | A. R. 839/05 | W. P. P. Z. 9850 යතුරු පැදිය |
| 08 | A. R. 748/03 | අංක 106-2864 වැලි යතුරු පැදිය |
| 09 | A. R. 385/02 | අංක 102 7726 යතුරු පැදිය |
| 10 | A. R. 750/03 | අංක 152-1619 යතුරු පැදිය |
| 11 | B 1258/02 | අංක 158-9595 කොළපාට යතුරු පැදිය |
| 12 | A. R. 1065/03 | අංක 50-8079 ඩෙලිකා වෑන් රථය |
| 13 | 41643 | W. P. H. 15088 රතුපාට ත්‍රී රෝද රථය |

## මහෙස්ත්‍රාත් අධිකරණය - දඹුල්ල

දඹුල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ සහ නාඋල සංචාරක අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද හා නඩු අංක සොයාගත නොහැකි වූ නඩු භාණ්ඩ 2009.09.26 වැනි දින පෙරවරු 10.00ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය පැවැත්වෙන දින පෙරවරු 9.30 සිට පෙරවරු 9.45 තෙක් වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිලිගැනෙන අවස්ථාවන් හිදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ සම්පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එවේලේ ම එදිනම පස්වරු 3.00 ට පෙර මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතු අතර , චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිළ දී ගැනීමට පැමිණෙන පුද්ගලයන් අනිවාර්යයෙන්ම ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතුය.

එච්. පී. ජී. එන්. රණවීර,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
දඹුල්ල.

2009 ජූලි මස 15 වැනි දින.
දඹුල්ල,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| | | |
|---|---|---|
| 01. | 18173 | අබලන් වේවැල් කුඩ 01 |
| 02. | 17311 | මැණික් ගරන වේවැල් කුඩ 01 ඉල්ලන් කූරු 01 |
| 03. | 12533 | තාච්චි 01 |
| 04. | 17930 | සවල් 01 |
| 05. | 17927 | සවල් 01 |
| 06. | - | කුලුගෙඩි 01 |
| 07. | 16544 | සවල් 01 |
| 08. | 17926 | සවල් 01 |
| 09. | 17928 | සවල් 01 |
| 10. | 16543 | අබලන් සවල් 01 |
| 11. | පී. ආර්. 27/01 | සවල් 01 |
| 12. | ඒ. ආර්. 1391/08 | අබලන් වතුර මෝටරය |
| 13. | ඒ. ආර්. 1392/08 | සවල් 02 තාච්චි 01 |
| 14. | 11637 | අත් කියත් 01 කියත් 01 යතුකැට 01 අතුකොලු 01, මිනුම් පටි 01, වරක්කල 01 |
| | 8277 | කුඩා කැති 01 |
| 15. | 14658 | සවල් 02 |
| 16. | | අඬුමිටි 02 කුඩා කුලු ගෙඩි 01 |
| 17. | 7129 | උදලු කෙටි 01 |
| 18. | - | අබලන් සවල් 01 |

| | | |
|---|---|---|
| 19. | - | අබලන් ටකරන් බාල්දි 01 |
| 20. | 6397(බී151/08) | (1) පොරොව 01 |
| | | (2) යකඩ උල් 02 |
| | | (3) රබර් බෙල්ට් 02 |
| | | (4) ස්පැනර් 01 ඇණ ගලවන යතුරක්. |
| | | (5) උලක් කළුනුලක් (06) මල් ඉස්කුරුප්පු නියන් 02 |
| | | (6) බෝල මිටි 01 |
| 21. | පී. ආර්. 91/05 | ඇලුමිනියම් අබලන් කේතලයක් |
| 22. | - | ටෝච් දෙකක් අඩංගු මල්ල |
| 23. | 13326 | බෙල්ට් දෙකක් අඩංගු කොළ පැහැති ඉටි මල්ල |
| 24. | 8278 | උදලු කෙටි 01 |
| 25. | 14592(බී989/08) | (i) උදලු කෙටි 01 |
| | | (ii) සවල් 01 |
| | | (iii) ඉරුණු ටෙන්ට් රෙදි කැබැල්ල |
| | | (iv) වාහන ස්පීකර් 01 |
| | | (v) ජැක් ලීවර් 01 හැඬලය |
| | | (vi) වීල් බ්‍රස් 01 |
| | | (vii) ස්පැනර් 02 |
| | | (viii) මල් ඉස්කුරුප්පු නියනයි |
| | | (ix) අඬු 01 |
| | | (x) ඇණ ගලවන යතුරු 02 |
| | | (xi) ජැක් 01 |
| 26. | 89477 | අලවංගු 01 |
| | | කැති 01 |
| | | කටුකම්බි රෝලකින් කොටසක් |
| 27. | 16253 | (1) යතුකැට 01 |
| | | (2) අත් කියතයි |
| | | (3) පීරක් |
| | | (4) විදුලි බුරුම 01 |
| 28. | 15474 | (i) යතුකැට 01 |
| | | (ii) මිටි 01 |
| | | (iii) අත් කියත් 01 |
| | | (iv) කියත් 02 |
| | | (v) වරක්කල 01 |
| | | (vi) අඬු 01 |
| 29. | 18626 | (i) උදළු කෙටි 02 |
| | | (ii) යකඩ ඉනි 02 |
| 30. | 71866 | රවුම් කියත් තල 01 |
| 31. | 71866 | කුක්ජි කේ. ටී 8 අත්ට්‍රැක්ටරය |
| 32. | 16528(බී310/04) | ස්වයංක්‍රිය දම්වැල් කියත් 01 |
| 33. | 13132(බී849/08) | 365 ස්පෙෂල් වර්ගයේ ස්වයංක්‍රිය දම්වැල් කියත් 01 |
| 34. | 74395(බී1485/05) | මාදිලි අංක 11290210860 දරන ස්වයංක්‍රිය දම්වැල් කියත් 01 |
| 35. | 14040 | 365 ස්පෙෂල් අංක 9670824-00 එස්.එන්. 051300653 දරණ යාන්ත්‍රික දම්වැල් කියත් |
| 36. | 88291(බී1014/06) | යාන්ත්‍රික දම්වැල් කියත් 01 |
| 37. | 99755(බී862/07) | (i) යාන්ත්‍රික දම්වැල් කියත් 01 |
| | | (ii) පොරොව 01 |
| | | (iii) කඹ 01 |
| 38. | 5157(බී851/07) | කොහුලනු අඩංගු පොහොර උරය |
| 39. | 68183(බී239/05) | (i) ගෑස් ලිප් 01 |
| | | (ii) ගෑස් සිලින්ඩර් 01 |
| 40. | 13922(බී929/08) | (i) උදැල්ලයි |
| | | (ii) ලනු තොගයක්. |
| 41. | 81398(බී678/05) | (i) එරික්සන් වර්ගයේ අළුපාට ජංගම දුරකථනය. |
| | | (ii) ජංගම දුරකථන ඇසුරුම් 03 |
| 42. | 13326 | අත්ට්‍රැක්ටරයක ටේලරය කොටස |
| 43. | 1721(බී731/07) | (i) අඩි 06 යි අඟල් භාගයක් දිග යකඩ ඉනි 01 |
| | | (ii) අඩි 06 යි අඟල් භාගයක් දිග යකඩ ඉනි 01 |
| | | (iii) ඇලුමිනියම් බාල්දි 02 |
| | | (iv) රතු පාට හයිඩ්‍රොලික් ජැක් 01 |
| | | (v) මිට සහිත උදළු 01 |
| | | (vi) 1100 වර්ගයේ ජංගම දුරකථනය |
| 44. | (නාඋල) | මිට සහිත කුඩා කුළු ගෙඩි 05 |
| 45. | (නාඋල) | මිට සහිත කුඩා කුළු ගෙඩි 05 |
| 46. | | මිට සහිත ලොකු කුළු ගෙඩි 02 |
| 47. | | මිට සහිත කුඩා ලොකු ගෙඩි 01 |
| 48. | | බන්ඩි කියත් 01 |
| 49. | | බන්ඩි කියත් 01 |
| 50. | | බන්ඩි කියත් 01 |
| 51. | | අඩි 05 ක් පමණ දිග කම්බි කූරු 05 |
| 52. | | මිට සහිත ලොකු ඉරුම් කියත් 01 |
| 53. | | මිට සහිත ලොකු ඉරුම් කියත් 01 |
| 54. | | මිට සහිත ලොකු ඉරුම් කියත් 01 |
| 55. | | මිට සහිත ලොකු ඉරුම් කියත් 01 |
| 56. | | මිට සහිත ලොකු ඉරුම් කියත් 01 |
| 57. | | මිට සහිත ලොකු ඉරුම් කියත් 01 |
| 58. | | මිට රහිත ලොකු ඉරුම් කියත් 01 |
| 59. | | අබලන් පස් තාච්චි 05 |
| 60. | | අබලන් පස් තාච්චි 04 |
| 61. | | අබලන් ඇලුමිනියම් කළ 01 |
| 62. | | අබලන් මිට සහිත සවල් 05 |
| 63. | | අබලන් මිට සහිත සවල් 05 |
| 64. | | අබලන් මිට සහිත සවල් 05 |
| 65. | | අබලන් මිට සහිත සවල් 05 |
| 66. | | අබලන් මිට සහිත සවල් 05 |
| 67. | | අබලන් මිට සහිත සවල් 05 |
| 68. | | අබලන් මිට සහිත සවල් 05 |
| 69. | | අබලන් මිට සහිත සවල් 05 |
| 70. | | අබලන් මිට සහිත සවල් 05 |
| 71. | | අබලන් මිට සහිත සවල් 05 |
| 72. | | අබලන් මිට සහිත සවල් 05 |
| 73. | | අබලන් මිට සහිත සවල් 05 |
| 74. | | අබලන් මිට සහිත සවල් 05 |
| 75. | | අබලන් මිට සහිත සවල් 05 |
| 76. | | අබලන් මිට සහිත සවල් 05 |
| 77. | | අබලන් මිට සහිත සවල් 03 |
| 78. | | අබලන් මිට රහිත සවල් 05 |
| 79. | | අබලන් මිට රහිත සවල් 05 |
| 80. | | අබලන් යකඩ බාල්දි 05 |
| 81. | | අබලන් යකඩ බාල්දි 05 |
| 82. | | අබලන් යකඩ බාල්දි 05 |
| 83. | | අබලන් යකඩ බාල්දි 05 |
| 84. | | අබලන් යකඩ බාල්දි 05 |
| 85. | | අබලන් වේවැල් කුඩ 10 |
| 86. | | මැණික් ගරන කුඩ 01 |
| 87. | | කැති 05 |
| 88. | | කැති 05 |
| 89. | | කැති 02 |
| 90. | | මිට සහිත උදළු කෙටි 05 |
| 91. | | මිට සහිත උදළු කෙටි 04 |
| 92. | | මිට රහිත උදළු තල 05 |
| 93. | | මිට රහිත උදළු තල 03 |
| 94. | | පොරොව 02 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 95. | | පොරොව 02 | 105. | | | ඉරුම් කියත් තලය සමඟ වඩු බංකුව |
| 96. | | පොරොව 02 | 106. | | | යකඩ පටිවලින් සෑදූ වඩු මේසයක කොටසක්. |
| 97. | | පොරොව 02 | | | | |
| 98. | | පොරොව 02 | 107. | 14953 | | ගඩොල් ගොඩක් |
| 99. | 13326 | ට්‍රේලර් කොටස | 108. | 94175 | (i) | කටුකම්බි රෝලකින් කොටසක් |
| 100. | 13326 | ඉරුම් කියත සමඟ වඩු බංකුව | 109. | 94175 | (i) | සිවිලින් කොකු 13 ක් අඩංගු උරය |
| 101. | (බී151/08)6397 | එඩ්ග්‍රෝ වර්ගයේ අත්ට්‍රැක්ටර් මැෂිම | 110. | 94175 | (i) | සීට් කොකු අඩංගු කුඩා පොහොර බෑගය. |
| 102. | | ඉරුම් කියත් තලය සමඟ වඩු බංකුව | | | | |
| 103. | | ඉරුම් කියත් තලය සමඟ වඩු බංකුව | 111. | | | තලන ලද තඹ බට තොගයක්. |
| 104. | | ඉරුම් කියත් තලය සමඟ වඩු බංකුව | | | | |

08-373

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

2010 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2010 ජනවාරි මස 01 දින සිට 2010 දෙසැම්බර් මස 31 දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුනු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිලදී ගැනීම සඳහා 1982 අගෝස්තු 20 දින, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද, දැනට බල පවත්නා සියළුම සුරාබදු කොන්දේසි වලට හා පහත සඳහන් කොන්දේසි වලට ද යටත්ව 2009.09.28 දින පෙ.ව. 10.30 දක්වා මවිසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

01. රා රේන්ද ලබා ගැනීමට ඉදිරිපත් වන අය, ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා, ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කුවිතාන්සියක් ද, ප්‍රකාශිත රේන්ද කොන්දේසි පරිදි ලබාගත් වත්කම් සහතිකයක්ද, සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා, එහි මුදුනේ වම් කෙලවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමේ අංකය හා නම ද පැහැදිලිව ලියා, ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන්, කටාන ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැළැස්විය යුතුය.

02. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය වන 2009.09.28 වැනි දින පෙ.ව. 10.30 ට සියළුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

04. කිසියම් කරුණක් සටහන් නොකොට ඇති ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කටාන ප්‍රාදේශීය ලේකම් සතු වේ.

05. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2009.11.20 දින ද පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූලවිය යුතුය.

06. තනි වරප්‍රසාද මිලදී ගත් තැනැත්තායැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින, එනම් රේන්ද විකුණූ දින ප.ව. 2.00ට පෙර කටාන ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක රේන්ද මුදල් කොටසට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් ඔහුට ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

07. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එම්. එච්. ජී. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
කටාන.

2009 ජූලි මස 31 වැනි දින,
කටාන, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය 2010

| අනුක්‍රමික අංකය | තැබෑරුමේ නම සහ අංකය | කොට්ඨාසය | තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොට්ඨාසය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල | ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|---|---|
| 01 | මූකලන්ගමුව අංක : 13 | කටාන | මූකලන්ගමුව ගමේ පමණක් | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | රු. 4,000 | 2009.09.28 පෙ.ව. 10.30 |
| 02 | කටුනායක අංක : 14 | කටාන | කටුනායක ගමේ පමණක් | පෙ. ව. 11.00 ප.ව. 5.00 | ප.ව.2.00 ප.ව. 8.00 | රු. 4,000 | 2009.09.28 පෙ.ව. 10.30 |
| 03 | ඇත්ගාල අංක : 13 | කටාන | ඇත්ගාල ගමේ පමණක් | පෙ.ව.11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | රු. 500 | 2009.09.28 පෙ.ව. 10.30 |
| 04. | නැ/කටාන අංක : 24 | කටාන | නැ/කටාන ගමේ පමණක් | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | රු. 2000 | 2009.09.28 පෙ.ව. 10.30 |
| 05. | දෙමන්හන්දිය අංක : 27 | කටාන | දෙමන්හන්දිය ගමේ පමණක් | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | රු. 2000 | 2009.09.28 පෙ.ව. 10.30 |
| 06. | බම්බුකුලිය අංක 26 | කටාන | බම්බුකුලිය ගමේ පමණක් | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | රු. 1000 | 2009.09.28 පෙ.ව. 10.30 |

08-369

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

### ක්ෂත්‍රිය හෝල්ඩිංස් පීඑල්සී හි යෝජිත ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩු කිරීම

සම්පූර්ණයෙන් ගෙවා නිමි සාමාන්‍ය කොටස් 98,397,640 කින් නියෝජනය වන සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය, වන රු. 983,976,400, 2007 අංක 7 දරන සමාගම් පනතේ 59 වැනි වගන්තිය ප්‍රකාරව සම්පූර්ණයෙන් ගෙවා නිමි සාමාන්‍ය කොටස් 98,397,640 කින් නියෝජනය වන රු. 200,000,000 කට අඩු කළ යුතු යැයි සමාගමේ කොටස්හිමියන්ට නිර්දේශ කළයුතු යැයි ක්ෂත්‍රිය හෝල්ඩිංස් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනාවක් ස්ථිර කළ බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත සඳහන් අඩුකිරීම සිදු කරනු ලබනුයේ සමාගමේ ඉදිරියට ගෙන ආ පාඩු එහි ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 783,976,400 ප්‍රමාණයකට හිලවු කිරීමෙනි. එහි දී සමාගමේ නිකුතු සහ පූර්ණ වශයෙන් ගෙවා නිමි සාමාන්‍ය කොටස් සංඛ්‍යාවට කිසිදු වෙනසක් නොකොට ශේෂ පත්‍රයේ වර්ෂ 2009 ක් වූ මැයි මස 31 වැනි දිනට සමාගමේ ඉදිරියට ගෙන යන පාඩු සහ සමාන මුදලක් පොතෙන් ඉවත් කරනු ලැබේ.

යෝජිත ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩු කිරීම සඳහා විශේෂයෙන් සම්මත කරගනු ලබන යෝජනාවක් මඟින් කොටස් හිමියන්ගේ අනුමතිය ලබා ගැනීම සඳහා සමාගමේ අතිවිශේෂ මහා සභා රැස්වීමක් වර්ෂ 2009 ක් වූ ඔක්තෝබර් මස 8 වැනි දිනට කැඳවීමට නියමිත ය.

ක්ෂත්‍රිය හෝල්ඩිංස් පීඑල්සී හි ලේකම්වරු.

08-437

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය, වෝටර් පිල් බෑන්ක් (උඩ කොටස) දරන ස්ථානයේ පදිංචි අජන්තා වීරසූරිය වන මා විසින් නුගේගොඩ, උඩහමුල්ල, කුඹුක්ගහපොකුණ පාර, අංක 35/20 දරන ස්ථානයේ පදිංචි කංකානම් ගමගේ දොන් සුදත් ධර්මසිරි යන අය වෙත ප්‍රධානය කරන ලද ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජී. ආර්. අජිත් කුමාර මහතා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2007ක් වූ මාර්තු මස 26 වැනි දිනැති අංක 250 දරන ඇටෝර්නි බලපත්‍රය වහාම බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන ලද බවත්, එකී කංකානම් ගමගේ දොන් සුදත් ධර්මසිරි විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මින් ඉදිරියට මා වග නොකියන බවත් ඒ සම්බන්ධ කිසිදු වගකීමකට නොබැඳෙන බවත් ප්‍රකාශකර සිටිමි.

අජන්තා වීරසූරිය.

08-489

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

කොස්ගම, වැරැල්ල මණ්ඩිය අංක 503/2 හි පදිංචි කඳාන ආරච්චිගේ දයාරත්න යන මට ජී. යූ. පුෂ්පකුමාර ප්‍රසිද්ධ නොතාරිස් තැන ලියා සහතික කළ වර්ෂ 2007.06.15 දිනැති 2119 දරන ඇටෝර්නි බලකරය මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකාවාසී සියලු දෙනාට මෙයින් දැනුම් දෙමි.

මෙයට,

කේ. ඒ. දයාරත්න
ඇටෝර්නි බලකරු.

08-413

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ දැන්වීමයි

ලියාපදිංචි කළ දිනය : 2009.07.26
සමාගමේ නම : අයි. එස්. ටී. ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 68627
ලියාපදිංචි කාර්යාලයඃ නො. 33, ඒ/1, මුහන්දිරම් මාවත, දෙහිවල.

ලේකම්වරු,
ඉනෝමීඩියා ලංකා ටී (ප්‍රයිවට්) ලිමිටඩ්.

08-418

## ෆස්ට් කැපිටල් හෝල්ඩිංස් පීඑල්සී හි යෝජිත ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩුකිරීම

සම්පූර්ණයෙන් ගෙවා නිමි සාමාන්‍ය කොටස් 33,750,000 කින් නියෝජනය වන සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය, වන රු. 307,479,913 2007 අංක 7 දරන සමාගම් පනතේ 59 වැනි වගන්තිය ප්‍රකාරව සම්පූර්ණයෙන් ගෙවා නිමි සාමාන්‍ය කොටස් 33,750,000 කින් නියෝජනය වන රු. 227,500,000 කට අඩු කළ යුතු යැයි සමාගමේ කොටස්හිමියන්ට නිර්දේශ කළයුතු යැයි ක්ෂත්‍රිය හෝල්ඩිංස් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනාවක් ස්ථිර කළ බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත සඳහන් අඩුකිරීම සිදු කරනු ලබනුයේ සමාගමේ ඉදිරියට ගෙන ආ පාඩු එහි ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 159,979,913 ප්‍රමාණයකට හිලවු කිරීමෙනි. එහි දී සමාගමේ නිකුතු සහ පූර්ණ වශයෙන් ගෙවා නිමි සාමාන්‍ය කොටස් සංඛ්‍යාවට කිසිදු වෙනසක් නොකොට ශේෂ පත්‍රයේ වර්ෂ 2009 ක් වූ මැයි මස 31 වැනි දිනට සමාගමේ ඉදිරියට ගෙන යන පාඩු සහ සමාන මුදලක් පොතෙන් ඉවත් කරනු ලැබේ.

යෝජිත ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩු කිරීම සඳහා විශේෂයෙන් සම්මත කරගනු ලබන යෝජනාවක් මඟින් කොටස් හිමියන්ගේ අනුමතිය ලබා ගැනීම සඳහා සමාගමේ අතිවිශේෂ මහා සභා රැස්වීමක් වර්ෂ 2009 ක් වූ ඔක්තෝබර් මස 8 වැනි දිනට කැඳවීමට නියමිත ය.

ෆස්ට් කැපිටල් හෝල්ඩිංස් පීඑල්සී හි ලේකම්වරු.

08-436

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මුල්ලේරියාව නව නගරය, හිඹුටාන, සමගි මාවත, අංක 291/6 හි පදිංචි චිත්‍රානන්ද වසන්ත කුමාර සුවන්දආරච්චි වන මම, මා විසින් සී. එච්. ගමගේ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2006.07.28 දින සහතික කළ අංක 5837 දරන ඇටෝර්නි බලපත්‍රය පිට මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත්කළ මුල්ලේරියාව නව නගරය, හිඹුටාන, සමගි මාවත, අංක 291/6 හි පදිංචි කනපැද්දල ගමගේ චම්පා කමල් යන අයට එකී ඇටෝර්නි බලපත්‍රයෙන් දී තිබූ ඇටෝර්නි බලය 2009.07.24 දින සිට අවලංගු කරන බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලුම පුරවැසියන් ට මෙයින් දන්වා සිටිමි.

08-484

## දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) දරන ඡේදය යටතේ දැන්වීමයි

සමාගමේ නම : සනාස් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 68208
සංස්ථා ගත කළ දිනය : 2009 ජූනි 24
කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය : 240 ඒ. කෙරවලපිටිය පාර, හැඳල, වත්තල.

ලේකම්වරුන්.

08-374

## දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) දරන ඡේදය යටතේ

සමාගමේ නම : හෙල්ප් ටු සර්වයිව්
සමාගමේ අංකය : ජීඒ 2267
සංස්ථාගත කළ දිනය : 2009 ජූනි 22
කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය : 15, ද සිල්වා පාර, දෙහිවල.

ලේකම්වරුන්

08-375

## දැන්වීම

බී. එච්. නලින් ආර්. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් මහතා විසින් ලියා සහතික කළ 2009.04.06 සහ අංක : 3045 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයේ ඇටෝර්නි අධිපති වන මා මලලගේ සුදීර චමිත් පීරිස් යන අය වාද්දුව ගාලුපාරේ 446 දරන ස්ථානයේ පදිංචි ලමා අප්පුලාගේ අනුර ජයන්ත මහතාට පවරන්නට යෙදුනු ඇටෝර්නි බලය මෙතැන් පටන් බල පැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කොට නිශ්ප්‍රභා කරමි.

එම ඇටෝර්නි බලපත්‍රය නිශ්ප්‍රභා කිරීමේ හේතුවෙන් එහි අන්තර් ගත සියලු කරුණු අද දින පටන් අහෝසි වන බවද මෙයින් ප්‍රකාශ කරමි.

08-378

## මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පහත සඳහන් සමාගම 2009.05.25 දින ආරම්භ කළ බව දන්වා සිටිමු.

සමාගමේ නම : එස්. බී. ෆිනෑන්ස් ඇන්ඩ් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් කම්පැනි (පීවීසී) එල්ටීඩී
සමාගමේ අංකය : පීවී 67375
ලියාපදිංචි කාර්යාලය : හක්මන පාර, මහ වීදිය. දෙයියන්දර.

අධ්‍යක්ෂක.

08-379

**2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කෙරෙන නිවේදනයයි**

ඒ ඇන්ඩ් යූ ක්‍රියේටිව් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2009 ජූලි මස 21 වැනි දින ලියාපදිංචි අංක පීවී 68507 යටතේ සංස්ථාපිතයි.

ලියාපදිංචි ලිපිනය : අංක 330/2, අකරවිට මාවත, හෝමාගම.

මැග්නි කන්සල්ටන්ස් ප්‍රයිවට් ලිමිටඩ්.
ලේකම්.

08-380

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : ලක්ජ්ෂියා (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 68618. 2009.07.29
ලියාපදිංචි ලිපිනය : අංක 10 මයිල්පෝස්ට් ඇවනියු, කොළඹ 03.

කන්සල්ටන්ට්ස් ඇන්ඩ් කෝපරේට්,
සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමටඩ්,
ලේකම්වරු.

දුරකථන අංකය : 2689618

08-382/3

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : ප්‍රිමියම් ඉන්ටර්නැෂනල් ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 68566, 2009.07.24
ලියාපදිංචි ලිපිනය : අංක 161, ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.

ලේකම්.

2009 ජූලි මස 31 වැනි දින දීය.

08-382/2

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : ඩැඩ්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 60367, 2007.06.22
ලියාපදිංචි ලිපිනය : 2ඒ, පමුණුව පාර, මහරගම.

කන්සල්ටන්ස් ඇන්ඩ් කෝපරේට්
සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

දුරකථන අංක : 2689618
2009 ජූලි මස 31 වැනි දින දීය.

08-382/1

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : ඉන්පා ඉලෙක්ට්‍රික් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 68484. 2009.07.17
ලියාපදිංචි ලිපිනය : නො. 232, ගාළු පාර, කොළඹ 03.

කන්සල්ටන්ට්ස් ඇන්ඩ් කෝපරේට්
සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

දුරකථන අංක : 2689618
2009 ක් වූ ජූලි මස 22 වැනි දින දීය.

08-381/3

---

**සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : සන්ෂයින් ලංකා මෝල්ඩිව්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලියාපදිංචි අංකය හා දිනය : පී. වී. 68490, 2009.07.20
ලියාපදිංචි ලිපිනය : අංක 26 බී, සමිට් ප්ලැට්ස්, ජාවත්ත පාර, කොළඹ 05.

ලේකම්.

2009 ජූලි මස 24 වැනි දින දීය.

08-381/2

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : ට්‍රෙෂර්වුඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් ලියාපදිංචි කළ අංකය හා දිනය : පී.වී. 68536, 2009.07.22
ලියාපදිංචි ලිපිනය : 307, කටුගස්තොට පාර, මහනුවර.

ලේකම්.

2009 ක් වූ ජූලි මස 24 වැනි දින දී ය.

08-381/1

### පොදු නිවේදනය

සමාගමක් පෞද්ගලික සමාගමක් බවට පත් කිරීම සමග එහි නාමය වෙනස් වීම

සමාගම් ආඥාපනත (145 අධිකාරය) යටතේ ලියාපදිංචි කරන ලද, කොළඹ 10, ඩීන්ස් පාර, අංක 400 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි, ක්වලිටි සීඩ් කොම්පැණි ලිමිටඩ් (සමාගම් අංක පීබී 510) 2007, අංක 7 දරන සමාගම් පනතේ (සමාගම් පනත) 29 ඡේදයේ නියමයන්ට අනුකූලව 2009 ජූලි මස 28 වැනි දින සිට පෞද්ගලික සමාගමක් බවට පත් කරනු ලැබූ හෙයින්, එම සමාගමෙහි නාමය ක්වලිටි සීඩ් කොම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් වෙනස් වූ බැව් සමාගම් පනතේ 11 (2) ඡේදයට අනුව සැලකිය යුතු බව, සමාගම් පනතේ 11 (5) ඡේදය යටතේ මින් නිවේදනය කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

හේලීස් ගෲප් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2009 ජූලි මස 31 වැනි දින,
අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10.

08-397

### ඇටෝර්නි බලතල බලරහිත කිරීමේ නිවේදනය

පන්නිපිටිය, හෝකන්දර උතුර, අංක 27/10 හි පදිංචි මෙරෙන්නගේ ඊස්වරි මහේෂිකා පෙරේරා වන මම, මොරටුව, කොරලවැල්ල, රිවර්සයිඩ් ගාඩ්න් හි අංක 65/10 සී හි පදිංචි වන්නාගොඩගේ නාලිකා ප්‍රියංගනී පෙරේරා යන අයව ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරන ලද මිලානෝහි ඒ වී වී ඇලෙක්සැන්ඩ්‍රා බිග්ලියාහි සොලිසිටර්වරයා විසින් සහතික කරන ලද 2008 නොවැම්බර් මස 28 වැනි දින දරන විශේෂ ඇටෝර්නි බලකරය 2009 අගෝස්තු මස 06 වැනි දින සිට අවලංගු කරන බවට මහජනතාවට සහ ශ්‍රී ලංකා ජනරජයට මෙයින් දන්වා සිටිනු ලබන අතර ඉහත සඳහන් දිනෙන් පසුව මාගේ ඇටෝර්නි බලකරු විසින් කරනු ලබන කිසිම ගනුදෙනුවකට මා වගකියනු නොලැබේ.

එම්. ඊ. එම්. පෙරේරා.

2009 අගෝස්තු මස 06 වැනි දින අත්සන් තබන ලදී.

08-492

### ඇටෝර්නි බලය අවලංගු කිරීම/ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ මාතර දිස්ත්‍රික්කයේ මාතර, හක්මන රදාවෙල, පල්ලාවෙල 'දිසානි' හි පදිංචිව සිටි දැනට කොළඹ දිස්ත්‍රික්කයේ පිළියන්දල, දාම්පේ යටියනවත්ත පාර, හැඩිගම අංක 43 සී - 14 ඒ හි පදිංචි ලක්සිරි රසික වීරබද්දන දිසානායක වන මම, මාතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. ජයසේන මහතා විසින් 2001.08.18 වැනි දින සහතික කරන ලද අංක 1048 දරන ඇටෝර්නි බලපත් පොතේ 227 කාණ්ඩයේ 170 පත් ඉරුවේ 8203 දිනපොත් අංකය යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාරත්මේන්තුවේ ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය මගින් එකී ශ්‍රී ලංකා ජනරජයේ මාතර දිස්ත්‍රික්කයේ මාතර, හක්මන රදාවෙල, පල්ලාවෙල, 'දිසානි' හි පදිංචි පවුලිස් වීරබද්දන දිසානායක නැමති අයට ලබාදුන් ඇටෝර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලැබූ බව ශ්‍රී ලංකා රජයත්, සියලු මහජනතාවත්, අන් සියලු දෙනාමත් මෙයින් දැනගනිත්වා.

එකී ඇටෝර්නි බලපත්‍රයේ සඳහන් ඇටෝර්නි බලකරු විසින් මෙදිනෙන් පසු මා වෙනුවෙන් කරනු ලබන ක්‍රියාවන් හෝ පියවරවල් සම්බන්ධයෙන් මා විසින් කිසිදු වගකීමක් භාරගනු නොලබන බව ද සියලු දෙනාම මෙයින් දැනගනිත්වා.

ලක්සිරි රසික වීරබද්දන දිසානායක.

2009ක් වූ ජූලි මස 13 වැනි දින දී ය.

08-522

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

### කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

රා සහ විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීම - 2010 වර්ෂය

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් හා විදේශීය මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී පවත්නා සෑම සුරාබදු කොන්දේසිවලටත් යටත්ව, 2010 වර්ෂය තුළ දී පහත සඳහන් උපලේඛනයන්හි දැක්වෙන රා තැබෑරුම්වල සහ (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුළුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් 2009.09.16 සහ 17 දිනයන් හි දී පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන වේලාවන් දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. (අ) සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝර්මයේ විය යුතුය.

(ආ) ටෙන්ඩර් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත් කර ලබා ගන්නා නිල කුවිතාන්සියක් ; සහ

(ඇ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථොක්ත රා තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල සහ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

(ඈ) ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිලිමත් විය යුතුය :

(i) ටෙන්ඩර්පත්‍ර මුලුමනින්ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කෙරෙන ගණන ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතුය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍ර වල නියමිත සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලට අමතරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංක ද යෙදිය යුතුය.

(iii) සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතුය.

(iv) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙකුම ටෙන්ඩර් පෝර්මය සමග තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය. මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා ලද නිල කුවිතාන්සියක්, වත්කම් පිළිබඳ සහතිකයත් සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පස ඉහළ කෙළවරේ නියමිත තැබෑරුම් අංකය සහ නම සඳහන් කර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රය තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර 'ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොත්මලේ'යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි සීඝ්‍රගාමී තැපෑලෙන් එවිය යුතුය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු, ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම එදින ප. ව. 2.00ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතුය. එම මුළු මුදල මා නමින් පුණ්ඩලූඔය මහජන බැංකුවේ වර්ෂයක ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතුය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුවක් විසින් ගෙවීම සඳහා ද යන්න සඳහන් කරන ලද චෙක් පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතුය.

අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතුය.

07. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

08. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතුය.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත්, රා තැබෑරුම් 2009.11.11 දින පෙ. ව. 10.30ට ද, විදේශ මත්පැන් 2009.11.12 දින පෙ. ව. 10.30ට ද මෙම ස්ථානයේ දී ම නැවත විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

11. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබා ගත හැකිය.

ජානක ධර්මකීර්ති,
ප්‍රාදේශීය ලේකම්.

2009 ජුලි මස 28 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අංකය හා රා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටිය ස්ථානය* | *ටෙන්ඩර් භාරගැනීම අවසන් වන වේලාව* | *ටෙන්ඩර් ඇප තැන්පත් මුදල (රු.)* |
|---|---|---|---|
| අංක 1 කඩදොරපිටිය | කඩදොරපිටිය ග්‍රාමය තුළ | 2009.09.16 පෙ. ව. 10.30 | 1,000 |
| අංක 2 ඕතලාව | තෝරාගනු ලබන ස්ථානයට කොත්මලේ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගත් ලිපියක් ඉදිරිපත් කළ යුතුය. | 2009.09.16 පෙ.ව. 10.30 | 1,000 |
| අංක 3 කටුකිතුල | කටුකිතුල ග්‍රාමය තුළ | 2009.09.16 පෙ. ව. 10.30 | 1,000 |
| අංක 02 විදේශ මත්පැන් | පුණ්ඩළුඔය නගරය | 2009.09.17 | 3,000 |
| තැබෑරුම පුණ්ඩළුඔය | ඉහල කඩවීදිය | පෙ. ව. 10.30 | |

08-469

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සීමාසහිත ඩී එෆ් සී සී වර්ධන බැංකුව**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 4817 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේපත්තුවේ, මහරගම නගර සභා සීමාවට අයත් පමුණුව පිහිටි දෙල්ගහවත්ත ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද අංක 1055 හා 1994 අගෝස්තු මස 05 වැනි දින දරන පිඹුරේ ලොට් අංක A1B ලෙස දැක්වෙන, සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය,

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූ. 0, පර්. 12.30.

එහි පිහිටි ගොඩනැගිලි, ගස්වැල්, වගාවන් සහ සියල්ල සහිතව මාර්ග අයිතිය ද සමග කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වලිසුන්දර විසින් සහතික කරන ලද, 2008 සැප්තැම්බර් මස 23 වැනි දිනැති අංක 4817 දරන උකස්කරය ප්‍රකාර මහරගම පදිංචි, දර්ශනී විදානගමගේ විසින් ඩී. එෆ්. සී. සී. වර්ධන බැංකුවට උකස් කරන ලදුව ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ඨ නොකරන ලද දේපළ ඩී. එෆ්. සී. සී. වර්ධන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 සැප්තැම්බර් මස 08 වෙනි දින (අඟහරුවාදා) පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 33,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න : දුරකථන අංක 011-2440366/77.


ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001 :2000
සහතිකය ලත්, ශ්‍රී ලංකාවේ පිළිගත්,
පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24 ටොරින්ටන් පාර,
මහනුවර,
දුරකථන අංකය : 081-2227593,
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371,
ඊමේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176,
ඊමේල් :schokman@samera 1892.com.

වෙබ් අඩවිය :www.schokmandsamerawickreme.com


08-475

### ඩී එෆ් සී සී බැංකුව

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 21561 හා 22388 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ගලුදූපිට පිහිටි, බලයලත් මිනින්දෝරු එච්. ආර්. සමරසිංහ විසින් සකසන ලද 2000 දෙසැම්බර් මස 04 වැනි දින දරන පිඹුරුපත් අංක 3189 ලොට් අංක 1, සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද 'කොස්ගහවත්ත' සහ 'දෙල්ගහවත්ත' ලෙස හැඳින්වෙන ඉඩම.
ඉඩමේ ප්‍රමාණය : අක්. 01 රූඩ් 02 පර්. 3.46.

එහි පිහිටි ගස්වැල්, වගාවන් සහ සියල්ල සහිතව.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. ඩබ්. රාජකරුණා විසින් සහතික කරන ලද, 2004 අප්‍රේල් මස 08 වැනි දිනැති අංක 21561 දරන සහ 2005 පෙබරවාරි මස 01 වැනි දිනැති අංක 22388 දරන උකස්කරයන් ප්‍රකාර මත්තුමගල (රාගම) සයිප්‍රස් ගාඩ්න් නම් ව්‍යාපාරය පවත්වාගෙන යන මත්තුමගල (රාගම) පදිංචි පහන්තිහගේ තිරල් ගාමිණී දාබරේ විජේගුණවර්ධන සහ පොන්වීර ආරච්චිගේ දෝන මේරි කාන්ති ෆ්ලෝරිඩා යන අය විසින්, ඩී එෆ් සී සී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වලදී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩී එෆ් සී සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 සැප්තැම්බර් මස 11 වැනි දින (සිකුරාදා), පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-* මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 32,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංකය : 011-2440366/77.

ශොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001 : 2000
සහතිකය ලත්, ශ්‍රී ලංකාවේ පිළිගත්,
පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ ඒජන්තවරු

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර,
දුරකථන අංකය : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය :*
290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 011-2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් :schokman@samera 1892.com

වෙබ් අඩවිය :www.schokmanandsamerawickreme.com.

08-476

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය ගැණුම්කරු : හෝමාගම, ගොඩගම, හයිලෙවල් පාර, අංක 155/5 හි, ගමගේ ගෘප්
කොටස්කරුවන් : කලිදූව විදාන ගමගේ වසන්ත දුමින්ද මහතා
කලිදූව විදාන ගමගේ පියදාස මහතා

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.04.17 දිනැති අංක 1,598 දරන *ගැසට් පත්‍රයේ* හා 2009.04.08 දිනැති ඩේලිනිව්ස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත් වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂය ද විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2009.10.08 වැනි දින පෙ. ව. 10.00 ට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේපත්තුවේ, ගොඩගම ග්‍රාමයේ පිහිටි අවිස්සාවේල්ල පාරේ, දැනට වරිපනම් අංක 615 (කොටස) දැන් 611 දරන බලයලත් මිනින්දෝරු එල්. වික්‍රමරත්න විසින් සාදන ලද 2002 නොවැම්බර් මස 24 දිනැති අංක 825 දරන පිඹුරෙහි ලොට් 30 බී ලෙස දක්වා විස්තර කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල සහ එහි ඇති ගොඩනැගිල්ල ද සහිතව එකී ලොට් 30 බී උතුරට අංක 825 දරන එම පිඹුරෙහි ම දක්වා ඇති ලොට් 30 ඒ ද, නැගෙනහිරට පාරෙන් ද, දකුණට හයිලෙවල් පාර ද, බස්නාහිරට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද 1980 මැයි මස 28 දිනැති අංක 2145 දරන පිඹුරෙහි දක්වා ඇති ලොට් 31 ද මායිම්ව ඉහත කී අංක 825 දරන පිඹුරට අනුව පර්චස් දහඅටක (අ. 0 රූ. 0 පර්. 18) හෙක්ටයාර් 0.0455 ක වපසරියකින් යුක්ත වන අතර, මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1409/150 ඒ හි ලියාපදිංචි කර ඇත.

තව ද, මේ සමග ම එයට දක්වා ඇති පාරේ අයිතිය ද වේ.

ඉහත කී ගොඩගම ග්‍රාමයේ පිහිටි එකී අංක 825 දරන පිඹුරෙහි ලොට් 30 ඒ (පාරට වෙන්කළ කොටස) ලෙස දක්වා විස්තර කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එකී ලොට් 30 ඒ උතුරට ලොට් සී පාර ද, නැගෙනහිරට පාරෙන් ද, දකුණට ලොට් 30 බී ද, බස්නාහිරට ලොට් 31 ද, මායිම්ව ඉහත කී අංක 825 දරන පිඹුර ප්‍රකාර පර්චස් දශම හතයි බිංදුවක (අ. 0 රූ. 0 පර්. 70) හෙක්ටයාර් 0.0018 ක වපසරියකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1409/150 බී හි ලියාපදිංචි කර ඇත.

සී. ඩබ්. වෙලගෙදර,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
නුගේගොඩ.

08-500

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ )

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් දැන්වීම

ආර්. එම්. විජේකුමාර
ගිණුම් අංක : 1010 5306 5761

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2007ක් වූ දෙසැම්බර් මස 27 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව බැඳුම්කර අංක 365 ප්‍රකාර රුපියල් තුන් ලක්ෂ විසිපන් දහස් හාරසිය අසූ දෙකයි ශත හැට හතක (රු. 3,25,482.67) මුදල ද, 2007 ඔක්තෝබර් මස 09 දින සිට අංක 365 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන් ලක්ෂ විසි දෙදහස් හත්සිය විස්සයි ශත හැට තුනක (රු. 3,22,720.63) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනයි දශම පහක් (13.5%) බැගින් වූ පොලිය ද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.05.07 දින රජයේ *ගැසට් පත්‍රයේ*, 2009.04.30 දින 'දිවයින', 'අයිලන්ඩ්' සහ 'තිනකුරල්' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2009.09.08 දින ප. ව. 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව තුළ බටහිර කපුගම ග්‍රාමයේ පිහිටි 'ගොඩකඳුරුවත්ත' යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන කේ. ජී. එස්. යාපා විසින් සාදන ලද 2005 අගෝස්තු මස 20 දාතම හා අංක 3806 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් එච් 05 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායම් උතුරට : එම ඉඩමේ ලොට් එච් 04, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් ඒ දකුණට : කුඹල්ගම සිට දෙවුන්දර දක්වා පාර (ගම්සභා පාර) සහ ලොට් ඒ සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් එච් 06 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (පර්. 30) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියළුම මාර්ග අයිතීන්ද, වෙනත් අයතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 3806 ට අනුව වෙළුම/පත්‍රිරුව බී 613/195 හි මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-521/11

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ )

### 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් දැන්වීම

එස්. පී. ලියනගේ සහ පී. ටී. එල්. පීරිස්
ගිණුම් අංකය : 1003 5025 3577

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.06.24 දිනැතිව සම්මත කරගන්නා ලදුව 2009.05.07 දින රජයේ *ගැසට් පත්‍රයේ* සහ 2009.05.04 දින 'දිවයින', 'ද අයිලන්ඩ්' සහ 'තිනක්කුරල්' යන දිනපතා පළවන පුවත්පත්වල පළකරන ලද දැන්වීම් පරිදි මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය විසින් පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රය රුපියල් එක් මිලියන එක්ලක්ෂ අසූපන්දහස් දෙසිය විසිපහයි ශත තිස් හතක (රු. 1,185,225.37 ක් පමණයි) මුදල සමග තවත් රුපියල් එක් මිලියන එක්ලක්ෂ විසිහත් දහස් අටසිය තිස් එකයි ශත තිස්පහක (රු. 1,127,831.35 ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට පහළොවක් (15%) බැගින් වූ පොලී මුදලක් ද 2007 මාර්තු 07 වැනි දින සිට විකුණුම් දින තෙක් පොලී මුදල් ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී ස්ථානයේ දී ම 2009.09.09 දින පෙ. ව. 10.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට අයත් වූ සල්පිටි කෝරළේ පල්ලෙ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති ගංගොඩවිල යන ගම පැගිරිවත්ත පාර කහටගහවත්ත ඉඩමේ වරිපනම් අංක 75/2 හි ලොට් අංක 1 බී 1 ලෙස වඩාත් මැනවින් විස්තර කොට ඇති බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් බෙදා වෙන් කොට මැන සාදන ලද 1984 අගෝස්තු 31 දාතම හා අංක 2096

දරන පිඹුර පරිදි උතුරට ජී. එල්. බී. නානායක්කාර විසින් සාදන ලද 1976 පෙබරවාරි මස 28 දාතම හා අංක 707 දරන පිඹුරේ ලොට් අංක 01 ද, නැගෙනහිරට පාර ද, දකුණට එම ඉඩමේ අංක 2096 දරන පිඹුරේ ලොට් 1 බී 2 ද, බටහිරට : වී. ඩබ්. කරුණාරත්නට අයිති ඉඩම ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහයක් (අ. 0 රූ. 0 පර්. 10) විශාලැති ඉඩම ද ඊට අයත් සියලු දේ ද ගහ කොළ, වැව්ලි, ගොඩනැගිලි ඇතුළු සියලු දේ ද සමග වූ ගල්කිස්ස ඉඩම් කාර්යාලයේ වෙළුම/පත් ඉරුව එම් 1436/26 හි ලියාපදිංචි වී ඇති පිඹුරු අංක 2096 හි දැක්වෙන ඉඩම හා පරිශ්‍රය.

ඉහත කී කහටගහවත්ත ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. ඩබ්. අබේසිංහ විසින් මැන සාදන ලද 1987 අප්‍රේල් මස 23 දාතම හා අංක 2484 දරන පිඹුරේ ලොට් 1 බී 2 ඒ ලෙස දැක්වෙන උතුරට : ලොට් 1 බී 1 ද, නැගෙනහිරට : පාර ද, දකුණට ලොට් 1 බී 2 ඉතිරි කොටස ද, බටහිරට : වී. ඩබ්. කරුණාරත්නට අයත් ඉඩම ද, යන මායිම් තුළ පිහිටි පර්චස් එකක් (අ. 0 රූ. 0 පර්. 1) විශාලැති ඉඩම ද ඊට අයත් සියලු දේ ද ගහකොළ, වැව්ලි ගොඩනැගිලි ඇතුළු සියලු දේ ද සමග වූ ගල්කිස්ස ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව එම් 1436/211 හි ලියාපදිංචි වී ඇති පිඹුරු අංක 2096 හි දැක්වෙන බිම් කොටස.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

08-521/12